# 2006 තුන්වන කාර්තුව තුල ශ්‍රී ලංකාවේ රැකියා නියුක්තිය සහ රැකියා වියුක්තිය පිළිබඳ තොරතුරු කෙටියෙන්
## (ශ්‍රී ලංකාවේ ශ්‍රමබල සමීක්ෂණය ආශ්‍රයෙනි)

රූපය 1 : රැකියා නියුක්ති ජනගහන ව්‍යාප්තිය – ප්‍රධාන කර්මාන්ත අනුව




## රැකියා නියුක්තිය

- 2006 තුන්වන කාර්තුව තුල වාර්තා වූ රැකියා නියුක්තිකයින්ගේ සංඛ්‍යාව දස ලක්ෂ 7 ක් පමණ වේ.
- රැකියා නියුක්ත වූවන් ගෙන් සේවා අංශයන්ට සම්බන්ධ රැකියාවල යෙදෙන්නන්ගේ ප්‍රතිශතය 42% කි.
- කර්මාන්ත අංශයේ රැකියා කරන්නවුන් වාර්තා වන්නේ 28% ක් වැනි ප්‍රතිශතයකි.
- කෘෂිකර්මාන්ත අංශයේ රැකියා කරන්නවුන්ගේ ප්‍රතිශතය 30% කි.

වගුව 1 : රැකියා නියුක්ති ජනගහන ව්‍යාප්තිය – ප්‍රධාන කර්මාන්ත අනුව

| වසර 2006 | කෘෂිකර්මාන්ත | කර්මාන්ත | සේවා |
|---|---|---|---|
| ජන–පෙබ–මාර්තු | 2347886 (33%) | 1853595 (26%) | 2934786 (41%) |
| පෙබ–මාර්තු–අප්‍රේ. | 2343842 (33%) | 1796745 (25%) | 3007526 (42%) |
| මාර්තු–අප්‍රේ.–මැයි | 2399029 (34%) | 1806914 (25%) | 2926363 (41%) |
| අප්‍රේ.–මැයි–ජුනි | 2319676 (33%) | 1795515 (26%) | 2906828 (41%) |
| මැයි–ජුනි–ජූලි | 2266637 (32%) | 1899272 (27%) | 2894568 (41%) |
| ජුනි–ජූලි–අගෝ. | 2127823 (30%) | 1905125 (27%) | 2986727 (43%) |
| ජූලි–අගෝ–සැප්. | 2122239 (30%) | 2017518 (28%) | 2972225 (42%) |

2006 වසරේ ඉහත කාලසීමාවල ඇස්තමේන්තු අගයන්ගේ පැහැදිලි වෙනස් වීමක් සංඛ්‍යානමය වශයෙන් පෙන්නුම් නොකරයි.

## විරැකියාව

- රැකියා විරහිත පුද්ගලයින් සංඛ්‍යාව ලක්ෂ 5 ක් පමණ වේ. ඉහත කාලය තුල වාර්තා වූ විරැකියා අනුපාතය 6.4% කි.
- මෙම කාල සීමාව තුල ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව විරැකියා අනුපාතය 9.8% ක් හා 4.6% ක අගයක් ගනී.
- කෙසේ වෙතත් වයස අවු– 20 – 24 වියෙහි පසුවන තරුණ තරුණියන්ගේ විරැකියා අනුපාතය 21.5% කි. උසස් පෙළ හා ඊට වැඩි සුදුසුකම් ඇති අයගේ විරැකියා අනුපාතය 11.3% කි.

වගුව 2 : විරැකියා අනුපාතයන් : 2006 (ජන – සැප් )

| වසර (2006) | විරැකියා අනුපාතය (%) |
|---|---|
| ජන–පෙබ–මාර්තු | 6.8 |
| පෙබ–මාර්තු–අප්‍රේ | 6.6 |
| මාර්තු–අප්‍රේ.–මැයි | 6.3 |
| අප්‍රේ.–මැයි–ජුනි | 6.4 |
| මැයි–ජුනි–ජූලි | 6.3 |
| ජුනි–ජූලි–අගෝ. | 6.6 |
| ජූලි–අගෝ–සැප්. | 6.4 |

- 2006 වසරේ ඉහත කාල සීමාවල ඇස්තමේන්තු අගයන් හා සැසඳිමට එම එක් එක් අගයන්ගේ නියදුම් දෝෂ සැලකිල්ලට ගත් විට එම එක් එක් අගයන්ගේ පැහැදිලි වෙනස් වීමක් සංඛ්‍යානමය වශයෙන් පෙන්නුම් නොකරයි.
- එහෙත් 2006 වසරේ මෙම ඇස්තමේන්තු අගයන් 2003, 2004 සහ 2005 වසරවල් හා සසඳන විට විරැකියා අනුපාතයේ පැහැදිලි අඩු වීමක් සංඛ්‍යානමය වශයෙන් පෙන්නුම් කරයි. (රූපය 2)

රූපය 2 : විරැකියා අනුපාතයන්




ශ්‍රී ලංකාව :විධිමත් /අවිධිමත් අංශයේ රැකියා නියුක්තිය




## අවිධිමත් අංශයේ රැකියා නියුක්තිය - කෘෂිකාර්මික හා කෘෂිකාර්මික නොවන අංශ අනුව : 2006 (ජනවාරි – සැප් )

- ශ්‍රී ලංකාවේ අවිධිමත් අංශයේ රැකියා නියුක්තිය 62% ක් ලෙසද, විධිමත් අංශයේ රැකියා නියුක්තිය 38% ක් ලෙසද සඳහා 2006 (ජනවාරි – සැප්තැම්බර්) කාලය තුල ඇස්තමේන්තු කර ඇත.
- කෘෂිකාර්මික අංශය සැලකූ විට, අවිධිමත් අංශයේ දායකත්වය 84% කි. විධිමත් අංශය - 16 % කි.
- කෘෂිකාර්මික නොවන අංශය සැලකූ විට, අවිධිමත් අංශයේ දායකත්වය 51% ක් වන අතර, විධිමත් අංශය 49 % කි.

(සටහන : මෙම ඇස්තමේන්තු වලින් ශ්‍රී ලංකාවේ උතුරු හා නැගෙනහිර පළාත් ආවරණය නොවුණි)